// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2130/49 - 2019 ජූලි මස 05 වැනි සිකුරාදා - 2019.07.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : - IR/COM/04/2017/139

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳවයි,

එල්. පී. ජයසුන්දර මයා,
නො. 14/3, ඉසුරුපුර,
කැස්බෑව,
පිළියන්දල.

සහ

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව,
අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ,
රාජගිරිය.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවින්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

කළුතර
නාගොඩ,
ශ්‍රී සෝහිත මාවත,
නො. 242,

ඔබඩගේ ලීලාරත්න මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

රවීන්ද්‍ර සමරවීර,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 ජූලි මස 01 දින,
කොළඹ දී ය.

මගේ අංකය : - IR/COM/04/2017/139

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

එල්. පී. ජයසුන්දර මයා,
නො. 14/3, ඉසුරුපුර,
කැස්බෑව,
පිළියන්දල.

සහ

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව,
අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ,
රාජගිරිය.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාවේ සේවය කළ එල්. පී. ජයසුන්දර මහතාට,

01 1993.10.07 දින සිට ලබා දී ඇති ලිපිකරු විශේෂ ශ්‍රේණිය තනතුරට අදාළ හිඟ වැටුප් 1993.10.07 දින සිට 1996.05.06 දින දක්වා නොගෙවීම.

02. නියමිත රාජකාරිවලට අමතරව ඉටු කරන ලද ණය එකතු කිරීමේ රාජකාරී කටයුතු වෙනුවෙන් දීමනාවක් ලබා නොදීම.

03. 2016.01.01 දින සිට ජ්‍යෙෂ්ඨ පාලන නිලධාරී තනතුරට උසස් කිරීමේ දී වැටුප් පරිවර්තනය නිසියාකාරව සිදු නොකිරීම.

04. 2014.10.20 දින සිට යන්ත්‍රෝපකරන අංශයේ කළමනාකරු (පාලන) තනතුරේ රාජකාරි ඉටු කළද එම තනතුර ලබා නොදීම.

යන කරුණු මගින් අසාධාරණයක් සිදුව තිබේද ? එසේ අසාධාරණයක් සිදු වී තිබේ නම් හිමිවිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 ජුනි මස 24 දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

07 - 683

---

මගේ අංකය : - IR/COM/01/2017/151

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳවයි,

කේ. එච්. රේමන් සුජීව මයා,
අංක 3586,
ගල්වැව හන්දිය,
සූරියවැව

සහ

චයිනා හාබර් ඉංජිනියරින් කම්පැනි ලිමිටඩ්,
අඩි 100 පාර,
මිරිජ්ජවිල,
හම්බන්තොට.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවින්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

රත්මලාන,
සිරිමල්උයන,
අරලිය මාවත,
නො. 03,

ආර්. එස්. ආරියප්පෙරුම මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

රවීන්ද්‍ර සමරවීර,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 ජූලි මස 02 දින,
කොළඹ දී ය.

මගේ අංකය : - IR/COM/01/2017/151

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

කේ. එච්. රේමන් සුජීව මයා,
අංක 3586,
ගල්වැව හන්දිය,
සූරියවැව

සහ

චයිනා හාබර් ඉංජිනියරින් කම්පැනි ලිමිටඩ්,
අඩි 100 පාර,
මිරිජ්ජවිල,
හම්බන්තොට.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,

''චයිනා හාබර් ඉංජිනියරින් කම්පැනි ලිමිටඩ් හි රියදුරෙකු ලෙස සේවය කළ කේ. එච්. රේමන් සුජීව මහතාට නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා නොදී විනය කරුනු මත ඔහුගේ සේවය අවසන් කිරීමෙන් ඔහුට අසාධාරණයක් සිදුව තිබේ ද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ.''

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 ජුනි මස 24 දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන දී.

07 - 684

මගේ අංකය : - IR/COM/01/2018/256

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව,

එම්. ඒ. කේ. ජයසිරි මයා,
''සිරිසරණි''
පොළොම්මාරුව,
තංගල්ල.

සහ

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය,
1 වන මහල,
කම්කරු මහලේකම් කාර්යාලය,
කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

කළුතර
නාගොඩ,
ශ්‍රී සෝභිත මාවත,
නො. 242,

ඕබඩගේ ලීලාරත්න මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

රවීන්ද්‍ර සමරවීර,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 ජූලි මස 02 දින,
කොළඹ දී ය.

මගේ අංකය : - IR/COM/01/2018/256

**ලංකවේ ව්‍යවසථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

එම්. ඒ. කේ. ජයසිරි මයා,
''සිරිසරණි''
පොළොම්මාරුව,
තංගල්ල.

සහ

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය,
1 වන මහල,
කම්කරු මහලේකම් කාර්යාලය,
කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,

''සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සේවය කරන එම්. ඒ. කේ. ජයසිරි මහතාට 2015.11.22 දින චෝදනා පත්‍රයක් නිකුත් කොට පවත්වන ලද විනය පරීක්ෂණයෙන් පසු දෙන ලද දඬුවම් (තනතුරු නාමය වෙනස් කිරීම, ක්‍රියාත්මක කිරීම් අංශයට අයත් රාජකාරි කටයුතුවලින් ඉවත් කිරීම, වසර දෙකක වාර්ෂික වැටුප් වර්ධක විලම්භනය කිරීම, ස්ථාන මාරු කිරීම හා වැඩ තහනම් කාලයට අදාළ වැටුප් හා සියළු දීමනා නොගෙවීම) මගින් ඔහුට යම් අසාධාරණයක් සිදුව තිබේද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද? '' යන්න පිළිබඳව වේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 ජූනි මස 24 දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන දී.

07 - 685

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.